දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 784807, 784832

ලේකම් / செயலாளர் / Secretary } 784811

කාර්යාලය / அலுவலகம் / Office } 785141-50, Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : secedu@sltnet.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
மனித வள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு
Ministry of Human Resources Development, Education & Cultural Affairs

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල.
'இசுருபாய', ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை, பத்தரமுல்ல.
"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/5/08/3/1/14

දිනය / திகதி / Date } 2003.08. 19

චක්‍රලේඛ අංක : 2003 / 30

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්,
පීඨාධිපතිවරුන්.

**<u>ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල හා වෙනත් ජාතික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනපති උපාධිය හා පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම.</u>**

අධ්‍යයන නිවාඩු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක.1995/24 හා 1995/29 දරණ චක්‍රලේඛයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

02. 1999.10.22 දිනැති ගැසට් නිවේදනයට අනුකූලව විශ්ව විද්‍යාලයන්හි හා වෙනත් ජාතික අධ්‍යාපන ආයතනවල සහිඅන්ත පාඨමාලා හදාරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ට, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන්ට, රජයේ පාසල්වල හා රජය අනුමත කරන ලද පෞද්ගලික පාසල්වල ගුරුවරුන්ට සහ පිරිවෙන්වල ගුරුවරුන්ට එම අවසන් විභාගයට සූදානම් වීම සඳහා එක් මාසයක වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදීමට අවකාශ ඇත. මේබිය අමාත්‍යාංශයේ පාලනයට අයත් ආයතනවල නිලධාරීන්ට සහ ජාතික පාසල්වල විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ට අධ්‍යයන නිවාඩු මෙම අමාත්‍යාංශය මඟින් අනුමත කරන අතර, පළාත් සභා පාසල්වල ගුරුවරුන් ඒ ඒ පළාත් සභාවේ අධ්‍යාපන ලේකම්වරුන් මඟින් නිවාඩු අනුමත කරවා ගතයුතු වේ.

03. මෙම අධ්‍යයන නිවාඩු කාලය උක්ත පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනට පෙර දින දක්වා වියයුතුය.

ජී.පී.ජී. ගුණසේකර
අතිරේක ලේකම් ( පාලන හා මුදල් )

අ.ක./ වී.කේ. නානායක්කාර
ලේකම්
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් :
1. ලේකම්, පාසල් සංවර්ධන අමාත්‍යාංශය
2. අමාත්‍යාංශයේ සියළුම අතිරේක ලේකම්වරුන්
3. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)
4. ජාතික පාසල් අධ්‍යක්ෂ
5. විගණකාධිපති